**ජාතික සමාජ සංවර්ධන ආයතනය - 2013**

---

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික සමාජ සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 21(ඇ) ඡේදය අනුව ශුද්ධ වත්කම්/ ස්කන්ධයන් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව ශුන්‍ය අගයක් ලෙස ගිණුම්වල පෙන්වා තිබූ දැනට භාවිතයේ පවතින වාහන 03 ක් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්වලට ගෙන නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.6,317,841 ක වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ඇතුළත් කිරීම වෙනුවට ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අරමුදලින් අඩුකර තිබුණි.

(ආ) ඵලදායී ජීවිත කාලය සීමිත නොවූ ඉඩම් ක්ෂය නොකළ යුතු නමුත්, ඉඩම් හා ගොඩනැගිලි වෙන්ව හඳුනා නොගෙන ඉඩම් වටිනාකම ගොඩනැගිලි සේ සලකා සියයට 5 බැගින් වාර්ෂිකව ක්ෂය කර තිබුණි.

(ඇ) ආසියා පදනමෙන් ලද මුදලින් මිලදී ගත් රු.503,246 ක පොත්, පුස්තකාල පොත් ගිණුමට හර කිරීම වෙනුවට අදාළ ප්‍රදානයෙන් අඩුකර දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම් නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන් කිරීම රු.102,529 කින් අඩුවී තිබූ අතර පාරිතෝෂික වෙන්කිරීම් ලෙස රු.1,471,816 ක් වැඩියෙන් ලාභයට එරෙහිව ලියාහැර තිබුණි.

**2.2.3 ගෙවිය යුතු ගිණුම්**

අවුරුදු 02 සිට 04 දක්වා කාලපරිච්ඡේදයට අදාළ රු.2,094,898 ක් ගෙවිය යුතු ශේෂයක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | තැන්පතු | | |
| | (i) සමාජ වැඩ පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන (M.S.W.) | 44,000 | තැන්පතු ලේඛන හා විස්තරාත්මක තොරතුරු |
| | (ii) සාමාන්‍ය තැන්පතු | 33,061 | |
| (ආ) | අස්පෘශ්‍ය වත්කම් (Microsoft license ) | 694,118 | ගිවිසුම් පත්‍රය |

**3. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**---------------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 751 | ගබඩාවට ලැබෙන සියළු දෑ ගබඩා ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවද සමාජ සංවර්ධන ප්‍රතිපත්ති පර්යේෂණ හා ප්‍රකාශන අංශය මඟින් සමාලෝචිත වර්ෂය තුළදී වැඩසටහන් සඳහා මුද්‍රණය කරන ලද රු.140,460 ක් වටිනා අත්පොත්, සඟරා හා ප්‍රකාශන ගබඩා ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3(iii) වගන්තිය | අධ්‍යයන හෝ පුහුණුව සඳහා විදේශ ගත වන අවස්ථාවේදී ඊට අදාළ සියලු වියදම් විදේශ නියෝජිත ආයතනය විසින් දරා තිබියදී එක් දිනකට ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 50 බැගින් අනියම් දීමනා ලෙස නිලධාරීන් තිදෙනෙකුට රු.186,156 ක මුදලක් වැඩිපුර දරා තිබුණි. |
| (ඇ) | 2001 ජූලි 02 දිනැති අංක 2001/03 එම්එෆ්/ජීඒ2 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය | පුහුණු හා විදේශ සංචාරවලට සහභාගි වී නැවත පැමිණි දින සිට සති දෙකක් ඇතුළත අදාළ පුහුණුව/විදේශ සංචාරයට අදාළ වාර්තා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු වුවත් 2010 වර්ෂයේ සිට 2013 ජූනි 30 දක්වා අවස්ථා 10 කදී ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන් 08 දෙනෙකු සහභාගි වූ විදේශ සංචාරයන්ට අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| | (i) 02(iv) වගන්තිය | දුරකථන බිල්පත් නිරවුල් කිරීමේදී උපරිම සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂය තුළදී රු.48,444 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| | (ii) 3.1 (ii) වගන්තිය | ජාත්‍යන්තර ඍජු දුරකථන පහසුකම් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එයට පටහැනිව නිලධාරීන් දෙදෙනෙකු සඳහා රු.12,666 ක ජාත්‍යන්තර ඍජු දුරකථන ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඉ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 01 වගන්තිය | 2013 අගෝස්තු 30 දිනැති අංක 121/08/2013 පාලක සභා තීරණය මත සම්බන්ධීකරණ කටයුතු සඳහා නිලධාරියෙකු පත් කර මාසයකට රු.30,000 බැගින් සමාලෝචිත වර්ෂයේ මාස 03 ක් සඳහා රු.90,000 ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | කාර්යාල උපකරණ හා යන්ත්‍රවලට අදාළ විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.7,806,700 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,228,093 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌනතාවයේ රු.2,578,607 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මේ සඳහා රජයේ ප්‍රදාන රු.12,375,742 කින් වැඩිවීම, වෙනත් ආදායම් රු.671,385 කින් වැඩිවීම, පුද්ගල පඩිනඩි සඳහා ගෙවීම් රු.9,000,712 කින් වැඩිවීම හා වෙනත් මෙහෙයුම් වියදම් රු.6,625,072 කින් වැඩිවීම හේතු වී තිබුණි.

**5. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**5.1 කාර්ය සාධනය**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට අයත් අනුරාධපුර තලාව පිහිටි පුහුණු මධ්‍යස්ථානයේ හා කැළණිය නේවාසිකාගාරයේ 2013 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) අධ්‍යයන කටයුතු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාජ සේවා විද්‍යාලයේ පුහුණු අංශය මඟින් පවත්වනු ලබන ප්‍රධාන පාඨමාලාවන් වන අවුරුදු එකහමාරක උපාධි හා ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා බඳවා ගතහැකි සිසුන් සංඛ්‍යාව 1,230 ක් වුවද, සිසුන් 852 ක් බඳවා ගෙන තිබුණි. තවදුරටත් සිසුන් 378 දෙනෙකු බඳවා ගැනීමට හැකියාවක් පවතින අතර එම ප්‍රමාණය මුළු බඳවා ගතහැකි සිසුන් ප්‍රමාණයෙන් සියයට 31 ක ප්‍රතිශතයක් නියෝජනය විය.

(ii) සමාජ වැඩ උපාධිය සඳහා 2006/2010 වර්ෂවලදී ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව 2009/2013 ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 26 ක අඩුවීමක්ද එම වර්ෂවල ලියාපදිංචි සංඛ්‍යාවෙන් උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 73 සිට සියයට 69 දක්වාද අඩුවී තිබුණි.

(iii) ක්‍රියාකාරී සැලැස්ම අනුව නිම කර තිබූ, උපදේශනය පිළිබඳව අවුරුදු එක හමාරක ඩිප්ලෝමා පාඨමාලාවන් 05 ක ප්‍රතිඵල ලබාදීම සඳහා මාස 05 සිට මාස 07 දක්වා කාලයක් ගත කර තිබූ අතරම, එම පාඨමාලාවලට අදාල උපාධි ප්‍රදානෝත්සවයන් 2014 මාර්තු 31 වන විටත් පවත්වා නොතිබුණි.

(iv) උපදේශන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවන් 03 ක් සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට ඉලක්ක කර තිබුණ ද 2013 දෙසැම්බර් 31 දින වන විටත් පාඨමාලා කටයුතු නිමකර නොතිබුණි.

(v) පුහුණු අංශය මඟින් කෙටිකාලීන පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා පුද්ගලයින් 480 ක ප්‍රමාණයකට පුහුණුවීම් ලබාදීම සඳහා සැලසුම් කර තිබුණ ද කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වී තිබුණේ පුද්ගලයින් 374 ක් පමණක් බැවින් මෙය ඉලක්ක ගත සංඛ්‍යාවෙන් සියයට 78 ක ප්‍රමාණයක් විය.

(ඇ) සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාඨමාලා හදාරා අවසන් වූ සමාජ වැඩ වෘත්තිකයන් පිළිබඳ සමීක්ෂණය මඟින් දත්ත බැංකුවට, අවුරුදු 30 ක් ඇතුළත (1980-2010) පිටවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිළිබඳ තොරතුරු ලබාගැනීම ඉලක්කය වුවද 2013 වර්ෂය තුළ රැස්කරගත් තොරතුරු ප්‍රගති වාර්තාවල සටහන් කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකාවේ වැඩිහිටි නිවාස පිළිබඳව තොරතුරු එකතු කිරීමේ පර්යේෂණය යටතේ දත්ත බැංකුවට වැඩිහිටි නිවාස 225 ක වැඩිහිටි ප්‍රජාව සම්බන්ධයෙන් තොරතුරු එකතු කිරීම සඳහා 2012 හා 2013 වර්ෂ තුළ සැලසුම් කර තිබුණද එම කාර්යයන් 2013 වසර තුළ ද නිම වී නොතිබුණි.

(iii) සමාජ වැඩ පිළිබඳව පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතිකපත් පාඨමාලාව සඳහා ක්‍රියාකාරි සැලැස්මේ රු.100,000 ක් වෙන් කර තිබුණ නමුත් සමාලෝචිත වර්ෂය තුළ එම පාඨමාලාව පවත්වා නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ පුවත් හසුන (News letter) ප්‍රකාශයට පත්කිරීම සඳහා වෙන්කරන ලද රු 50,000 ක මුදල් අදාළ කාර්යය ඉටුකිරීම සඳහා භාවිතා කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂයේ ප්‍රගති වාර්තා අනුව සමාජ සංවර්ධන ප්‍රතිපත්ති පර්යේෂණ හා ප්‍රකාශන අංශය මඟින් ලෝක සෞඛ්‍ය සංවිධානය හා පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව හා එක්ව් ශ්‍රී ලංකාවේ ආයතනගත ළමුන්ගේ පවතින තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීමේ පර්යේෂණය සඳහා රු 3,875,940 ක මුදලක් වෙන් කර තිබු අතර ක්‍රියාකාරි සැලැස්මෙන් පරිබාහිර වූ කාර්යයක් සඳහා රු.1,971,188 ක් වියදම් දරා තිබූ බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය .

(ඉ) පුස්තකාලය

-------------

2013 වර්ෂයේදි පුස්තකාලය සම්බන්ධයෙන් සැලසුම් කළ පහත සඳහන් කාර්යයන් ඉටුකර නොතිබුණි.

(i) 2013 වර්ෂය තුළ පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා රු.500,000 ක් වැය කිරීමට සැලසුම්කර තිබුණ ද, එම කාර්යය සඳහා රු.201,098 ක මුදලක් පමණක් දරා තිබුණි.

(ii) පුස්තකාලය පාවිච්චි කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා පුස්තකාලයට 2013 වර්ෂය තුළ නව ඡායා පිටපත් යන්ත්‍රයක් (photo copier) ගැනීමට සැලසුම් කර තිබුණ ද ඡායා පිටපත් යන්ත්‍රයක් ලබා දී නොතිබුණි.

(ඊ) ආයතනය මඟින් එස් සැන්ඩර්ස් අරමුදල, සොයිසා ශිෂ්‍යත්ව අරමුදල සහ රංජනි ජයලත් අරමුදල යන අරමුදල් වලින් ශිෂ්‍යත්ව 08 ක් ප්‍රදානය කර තිබුණු නමුත් එම කටයුතු සම්බන්ධව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා නොතිබුණි.

**5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය තුළ ජාතික සමාජ සංවර්ධන ආයතනයට ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීමට මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යානයෙහි ඉඩමක් ලබාගැනීමේ සැලසුම්ගත කාර්යය ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ආයතනය හා නාවල පාරේ අධ්‍යයන හා පර්යේෂණ අංශ කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන යාම නිසා කුලිය වශයෙන් රු.15,456,000 ක් ගෙවා තිබු අතර එම වටිනාකම මුළු ආදායමින් සියයට 22 ක්ද, මුළු වියදමින් සියයට 20 ක ප්‍රතිශතයක්ද විය.

(ආ) 2012 භාණ්ඩ සමීක්ෂණයේදී පෙන්වා දුන් පරිග්‍රහන ලේඛනයට ඇතුළත් කර නොමැති පොත් 2478 ක ප්‍රමාණයක් විගණිත දිනය දක්වා පරිග්‍රහන ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

**5.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත, තත්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| කාර්ය මණ්ඩල විස්තර | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| අධ්‍යයන | 58 | 43 | 15 |
| අනධ්‍යයන | 62 | 56 | 06 |
| එකතුව | 120 | 99 | 21 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සියයට 26 ක්ද අනධ්‍යාන කාර්ය මණ්ඩලයෙන් සියයට10 ක්ද වශයෙන් ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලය සියයට 18 ක් පුරප්පාඩුව පැවති අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් දෙදෙනෙකු විදේශ ගතවී තිබුණි.

(ආ) 2006 අප්‍රේල් 05 දිනැති අංක 06/0626/227/016 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ආයතනයේ අධ්‍යයන ප්‍රධානී වශයෙන් මහාචාර්යවරියක් වර්ෂයක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි. ඒ අනුව 2006 අප්‍රේල් 10 දින සිට 2007 අප්‍රේල් 09 වන දින දක්වා වර්ෂයක සේවා කාලයක් අවසන් වී තිබුණද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2007 අප්‍රේල් සිට 2013 නොවැම්බර් දක්වා එකතුව රු. 2,145,270 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව ආයතනයේ නිලධාරිණියක් සමාජ සේවා අමාත්‍යාංශයට මුදාහැර සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයෙන් රු.268,845 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**6.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 අප්‍රේල් 08 දින සභාගත කර තිබුණි.

**6.2 අයවැය පාලනය**

අයවැය ලේඛනය හා සත්‍ය ආදායම් වියදම් අතර සියයට 12 සිට සියයට 374 ක පරාසයක් තුළ සැලකිය යුතු විචලනයන් වූයෙන් ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණි.

**7. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගබඩා පාලනය
(ආ) ආපදා ණය
(ඇ) ලෙජරය පවත්වා ගැනීම
(ඉ) ගිණුම්කරණ පද්ධතිය
(ඊ) දුරකථන බිල්පත් පුතිපූර්ණය